# ශ්‍රී ලාංකේය අධ්‍යාපනය කෙරෙහි අෂ්ට මූලායතනයන්ගෙන් සිදු වූ ශාස්ත්‍රීය සේවාව

ආධුනික කථිකාචාර්ය වැලිවිට සොරත හිමි

ක්‍රි. පූ. 3 වන සියවසේ දි මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට බුදුදහම රැගෙන ඒමත් සමඟ බුදුසමයේ පැවති ඉගැන්වීම් ක්‍රමවේද ඇතුළත් සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය ද ලක්දිවට දායාද විය. ආර්. කේ. මුඛර්ජි නම් පඬිතුමා විසින් මුල් යුගයේ භික්ෂූන්ගේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ මෙසේ විග්‍රහ කර තිබේ. ''ශ්‍රාවක භික්ෂූන්ගේ ඉතිහාසය බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ ඉතිහාසයයි. වෛදික පිළිවෙත යාගහෝම මුල්කොටගෙන පැවතියාක් මෙන් භික්ෂූන්ගේ බෞද්ධ අධ්‍යාපනය විහාරය මුල් කොට සිද්ධ විය.''[1] මෙයින් පෙනී යන්නේ භික්ෂු අධ්‍යාපනය ආරාම සංස්කෘතිය පදනම් කරගෙන බිහි වූ බවය. බුද්ධකාලයේ සිටි භික්ෂූන්ගේ පරම අභිලාෂය වූයේ අධිගම ලාභය සඳහා විදර්ශනාව මුල්කරගත් බුද්ධි ප්‍රබෝධය ලබා ගැනීමය. එහෙත් කල්යත්ම විවිධ ලෞකික විෂයානුබද්ධ තාර්කික ඥානය හා පරසමයවාදයන් පිළිබඳවත් අදාළ භාෂා ශාස්ත්‍ර විෂයෙහි බහුශ්‍රැත බවත් නිතැතින්ම ලැබිය යුතු විය. ඊට හැඩගැසුණු පසුකාලීන භික්ෂූහු අධ්‍යාපනය ලබා ගැනීම සඳහා වෙහෙස ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපන සම්ප්‍රදායයන් බිහිවීම ආරම්භ විය. ඒ අනුව ලාංකීය භික්ෂු සංස්ථාව තුළ අධ්‍යාපන ක්‍රමවේදය ආරම්භ වූයේ මිහිඳු මාහිමියන්ගේ පැමිණීමත් සමඟය. දේවානම්පියතිස්ස මහරජතුමා විසින් උන්වහන්සේට කාලපාසාද පිරිවෙන නමින් ආරාමයක් ඉදිකරවා පූජා කිරීම පිළිබඳ තොරතුරු මහාවංසයෙහි[2] සඳහන් වන අතර එය ලක්දිව ඉදි වූ ප්‍රථම පිරිවෙන වශයෙන් ද හැඳින්වේ. මුල්කාලයේ ඉදි වූ සෑම ආරාමයක් ම 'පිරිවෙන' යන නමින් හඳුන්වා ඇති බව පෙනේ.

1. මිහිඳු හිමියන්ට ස්නානය කිරීම සඳහා කළ ස්ථානය ''සුණ්හාත පිරිවෙන'' නම් විය.

2. මිහිඳු හිමියන් සක්මන් කළ ස්ථානයේ තිබූ කුටිය ''දීඝචංකමන පිරිවෙන'' නම් විය.

3. උන්වහන්සේ ඵලසමාපත්තියට පැමිණි තැන සෑදූ කුටිය ''ඵලග්ග පිරිවෙන'' නම් විය.

4. අප්‍රමාණ දෙව් මිනිසුන් පැමිණ උන්වහන්සේට වැඳුම් පිඳුම් කළ ස්ථානය ''මරුගණ පිරිවෙන'' නම් විය.[3]

මහාවංසයෙහි සඳහන් වන අන්දමට මිහිඳු මාහිමියන්ගේ කාලයේ සෑද වූ පිරිවෙන් අතරින් ප්‍රධානත්වය ඉසිලූයේ මහරජුගේ ප්‍රධාන ඇමතියා විසින් කරන ලද ''දික්සඳ සෙනෙවියා'' නම් පිරිවෙනයි.

මේ සියලු ආයතනවල එකතුව මුල්කාලයේ හඳුන්වා ඇත්තේ මහාවිහාරය වශයෙනි. මෙරට ශාසන ඉතිහාසයේ පැරණිතම හා අග්‍රගණ්‍ය අධ්‍යාපන ආයතනය වූයේ ද මහාවිහාරයයි. දේවානම්පියතිස්ස රජතුමා විසින් ගොඩනංවන ලද මෙය වළගම්බා යුගය වනතෙක් ලාංකේය ථෙරීය අධ්‍යාපන සම්ප්‍රදායේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වී තිබුණි. ඓතිහාසික තොරතුරු සපයන තෝනිගල, රිටිගල, වෙස්සගිරි වැනි සෙල්ලිපිවල එන සාක්ෂිවලට අනුව මහාවිහාරයට

අමතරව දේවානම්පියතිස්ස රජු විසින් ම කරවන ලද ඉස්සර සමණ විහාරය, පාචීනාරාමය, වෙස්සගිරිය, උපාසිකාරාමය, හත්ථාළ්හක මෙහෙණවර, ජම්බුකොළ විහාරය, තිස්සමහාවිහාරය (රුහුණු ප්‍රදේශයේ) යන ස්ථානවල සිටි භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටකය ඉගෙනීම, දේශනා කිරීම, ආදි ශාසනික පිළිවෙත්වල නිරතවෙමින් මෙකී විහාරස්ථානයන්හි වැඩ වාසය කරමින් සිටි බව කියවේ. පාහියන් භික්ෂූන් වහන්සේ ලක්දිවට වැඩමවන යුගයේ මහාවිහාරයෙහි භික්ෂූන් තුන්දහසක් වූ බව උන්වහන්සේ විසින් සඳහන් කර තිබේ.[4]

මහාවිහාරය ආරම්භ වී ටික කාලයක් තුළ එය දේශීය අධ්‍යාපන ක්‍රමයේ කේන්ද්‍රස්ථානය බවට පත්විය. පසුකාලීනව දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරවන ලද ලෝවාමහාපාය අධ්‍යාපන කාර්යයන්හි මූලස්ථානය බවට පත් විය. නව මහල් ප්‍රාසාදයකින් යුත් මෙහි උඩු මහල් තලවල මහරහතන් වහන්සේලා වැඩ වාසය කළ අතර, තුන්වෙනි මහලෙහි සෝවාන් තත්වයට පත් අය සිටියහ. දෙවෙනි මහලෙහි ත්‍රිපිටකධාරී මහ තෙරවරුන් වාසය කළ අතර පහළ මාලය සියලු ආකාරයේ අධ්‍යාපන කාර්යයන් සඳහා වෙන් වී තිබුණි.[5] ලෝවාමහාප්‍රාසාදය ද මහාවිහාර සීමාව තුළ ඉදි වූ එකක් නිසා එය ද මහාවිහාරයට ම අයත් විය. මුල් කාලයේ පටන් ආරම්භ වූ මෙම මහාවිහාර අධ්‍යාපන සම්ප්‍රදාය තුළ නොයෙක් තෙරවරුන් ධර්ම ශාස්ත්‍රීය සේවාවන්හි යෙදී සිටි අයුරු ඉතිහාසගත තොරතුරු නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලිය. විදේශීය වශයෙන් පැමිණි බොහෝ උගතුන්ට පවා ධර්ම ශාස්ත්‍රීය කටයුතු කරගෙන යෑමෙහි ලා මහාවිහාරයෙන් සිදුවූ සේවාව අති මහත්ය.

මෙකී මහාවිහාර අධ්‍යාපන සම්ප්‍රදාය ත්‍රිපිටක භාණක තෙර පරපුර විසින් අඛණ්ඩව නිර්මලව ධාරණය මුල්කොට පැවත ආ බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ.[6] ඒ අතර අනෙකුත් ධර්මධර විනයධර උගත් තෙරවරු ස්වකීය ආචාර්ය පරම්පරාවන් සතු ස්වාධීන මතවාදයන් ද උගනිමින් හා ප්‍රචලිත කරමින් අධ්‍යාපන කාර්යයෙහි නිරත වූහ. මහාවිහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ක්‍රි. ව. 5 වන සියවසේදී ය. එනම් එම කාලවකවානුවේ දකුණු දිග ඉන්දියාවේ සිට ලක්දිවට පැමිණි බුද්ධඝෝෂ මාහිමියන් විසින් මහාවිහාරීය සම්ප්‍රදායට අනුකූල වන සේ රචනා කරන ලද අට්ඨකථා ග්‍රන්ථ නිසාය. මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට රැගෙන ආ පාලි අටුවා ග්‍රන්ථ මේ වන විට සිංහලෙන් පැවති නිසා (මිහිඳු හිමියන් ගෙනා අටුවා සිංහලයට පරිවර්තනය කළ බව මහාවංසයේ සඳහන් වේ.)[7] පාලි අටුවාවන්හි අඩුව සම්පූර්ණ කිරීම සඳහා බුදුගොස් හිමියන් මූලික වූ බව පෙනේ. එපමණක් නොව පසුකාලීනව රචනා වූ ධර්මය පිළිබඳ අර්ථකථා හා නිලීන තැන් විස්තර කිරීම සඳහා රචනා වූ ටීකා ග්‍රන්ථ ද, එමෙන් ම තවදුරටත් කරුණු පැහැදිලි කිරීම සඳහා රචනා වූ සන්න, ගැටපද, විවරණ ආදි ග්‍රන්ථාවලිය ද ඇති වූයේ ථෙරීය සම්ප්‍රදාය හා ඒ පිළිබඳ ආචාර්ය මතවාද ඉදිරිපත් කළ මහාවිහාරයීය සම්ප්‍රදාය මගිනි.

ථෙරීය සම්ප්‍රදායට පටහැනි වන ආකාරයට බිහි වූ තවත් අධ්‍යාපන ආයතනයක් වූයේ අභයගිරි සම්ප්‍රදායයි. දාඨිය නම් ද්‍රවිඩ පාලකයා මරා රාජ්‍යත්වයට පැමිණි වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා (ක්‍රි. පූ. 99-77) රජු මහාවිහාරය ආරම්භ වී වසර දෙසිය සතළොසක් ඉක්ම වූ පසු අභයගිරි විහාරය කරවා සතුරු ආක්‍රමණ සමයේ තමන්ට පිහිට වූ මහාතිස්ස තෙරුන්ට පූජා කළේය.[8] මෙම සිද්ධිය පදනම් කරගෙන මහාවිහාරීය භික්ෂූන් අතර මත භේදයක් ගොඩ නැගිණ.

පෞද්ගලිකව විහාරයක් පිළිගැනීම ථෙරීය සම්ප්‍රදායට පටහැනි නිසා නොසතුටට පත් මහාවිහාරීය භික්ෂූහු මහාතිස්ස තෙරුන්ට දෝෂාරෝපණය කළහ. මේ නිසා උන්වහන්සේගේ ශිෂ්‍ය බහලමස්සු තිස්ස තෙරුන් භික්ෂු පිරිසක් සමග අභයගිරියට ගොස් එහි විසීය.[9] මේ කාලයේ දඹදිව පල්ලාරාමයේ විසූ වජ්ජිපුත්තක නිකායට අයත් ධර්මරුචි නම් ආචාර්යවරයාගේ ශිෂ්‍ය පිරිසක් අභයගිරියට පැමිණ ඔවුන්ගේ මතවාද අභයගිරිකයන්ට උගන්වා ඇති අතර ඉන්පසු ඔවුහු ධර්මරුචි නිකාය වශයෙන් ප්‍රකට වූහ.[10] එතැන් සිට අභයගිරිවාසීහු දඹදිව නොයෙක් නිකායයන් සමග සම්බන්ධතා පවත්වමින් ශක්තිමත් අධ්‍යාපන සම්ප්‍රදායක් ගොඩ නැගූහ. මොවුහු ථෙරවාදයත්, මහායානයත් යන උභය ධර්මය ම හදාරමින් තම අධ්‍යාපන කටයුතු සිදු කරගෙන ගියහ. එහෙත් මහාවිහාරිකයෝ ථෙරීය සම්ප්‍රදාය අකුරට ම පිළිපදිමින් කටයුතු කළ බව වල්පොල රාහුල හිමියෝ පවසති.[11] මහාවිහාරයීය සම්ප්‍රදාය තම අනන්‍යතා භාෂාව වශයෙන් පාලි භාෂාව ම යොදා ගැණුනත් අභයගිරිකයන් මහායානය පිළිගත් නිසාත් මහායාන ග්‍රන්ථ වැඩි වශයෙන් රචනා වී ඇත්තේ සංස්කෘත භාෂාවෙන් නිසාත් ඒ කෙරෙහි වැඩි නැඹුරුතාවක් දැක් වූ බව සඳහන් වේ.[12]

ක්‍රි. ව. 334-361 කාලපරිච්ඡේදයේ ලක්දිව රාජ්‍යයට පත් මහසෙන් රජ සමයේ වෛතුල්‍යවාදය සමග මෙරටට පැමිණි සංඝමිත්‍ර නම් සොළී භික්ෂුව වෛතුල්‍යවාදයෙන් රජුට අනුශාසනා කොට ඔහු රවටා මහාවිහාරය විනාශ කරවීය.[13] මේ හේතුව නිසා මහාවිහාරවාසීන්ට දන්දෙන අයට දඩ නියම කිරීමට තරම් අභයගිරිවාසීහු ප්‍රබල වූහ. මහාවිහාරයේ වැඩසිටි ථෙරීය භික්ෂූහු රුහුණු ප්‍රදේශයට පළා ගියහ. අභයගිරිකයෝ මහාවිහාරය සතු සියලු දෑ තම යටතට ගත්හ. මෙයින් ප්‍රයෝජන ගත් සාගලික නමින් ප්‍රසිද්ධ වූ තිස්ස තෙරුන් ඇතුළු භික්ෂු පිරිස[14] නැවත අනුරාධපුරයට පැමිණ මහසෙන් රජුගේ අනුග්‍රහයෙන් මහාවිහාර සීමාවේ ම ජේතවන නම් විහාරයක් කරවාගෙන එහි විසූහ. මෙයින් ලක්දිව තුන්වන අධ්‍යාපන ආයතනය බිහිවූවා පමණක් නොව ''ජේතවන නිකාය'' වශයෙන් වෙනම නිකායක් ද බිහිවිය.

මහාවිහාර, අභයගිරි හා ජේතවන යන සම්ප්‍රදායයන්ගේ මූලිකත්වයෙන් ඇරඹුණු අධ්‍යාපන ක්‍රියාවලිය අනුරාධපුර රාජධානිය අවසන් වන තෙක් ම පැවති බව ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වේ. පසුකාලීනව මෙකී සියලු සම්ප්‍රදායයන් ගෙන් නොයෙක් ආචාර්යවරුන් යටතේ ගුරුකුල ආරම්භ විය. ඒවා අනුක්‍රමයෙන් පුළුල්ව සංවර්ධනයට පත්වීමෙන් මූලායතන බවට පත්විය. වියත්පත් අටගණය, අට අයතැන්, අෂ්ටායතන ආදි නම්වලින් දක්වා ඇත්තේ එකී මූලායතනයන් ය. මෙම විද්‍යාස්ථාන අට ගැන විවිධ මතවාද පවතී.

මහාථෙරෙනමට්ඨානං - අට්ඨායතන වාසිනං

ගාමාරඤ්ඤ නිවාසීනං - ථෙරානඤ්ච සතීමතං[15]

මහාවංස කතුවරයා අෂ්ටායතන ගැන සඳහන් කරන්නේ ඉහත ආකාරයටය. එසේම එහි එක් තැනෙක ''අට්ඨමූල විහාරෙසු යතයෝ ගරු සම්මතො''[16] යනුවෙන් ද තවත් තැනෙක අට්ඨායතනවාසීනං ථෙරානං ථිරසීලීනං''[17] යනුවෙන් දක්වා ඇත්තේ ද මෙකී අෂ්ට මූලායතනයන් යැයි කිව හැකිය. පොළොන්නරු සමය ගැන කරුණු සඳහන් කරන මහාවංස කතුවරයා මෙන් ම පූජාවලී කතුවරයා ද මෙකී අෂ්ටායතනය පිළිබඳ තොරතුරු සපයයි.

''මහළු පරාක්‍රමබාහු මහ රජතෙතමේ ඔටුනු පැළඳ රජ තැන්පත් වූ වළගම්බා රජයෙහි පටන් භින්න නිකායව තිබූ ශාසනය සමගි කොට පොළොන්නරුවේ සැගිරියේය අට ආයතනයට මහ පිළිම කරවා.....හෙරණ පැවිදි මහළු පැවිදි කරවා අට ආයතනයට පොළොන්නරුව රුපතින් වටනා පස ලවා එහි ද මහ දන් පවත්වා.......[18]

අෂ්ටමූලායතන ලෙස දැක්වෙන මේවා ඇතැමෙක් විද්‍යාස්ථාන අටක් යැයි ද, ඇතැමෙක් පදවි අටක් ලෙස ද, ඇතැමෙක් පරම්පරා අටක් යැයි ද හඳුන්වති.[19] ඒ අනුව බොහෝ ස්ථානයන්හි දක්නට ලැබෙන පරිදි අෂ්ටමූලායතන වන්නේ

1. සේලන්තර මූලායතනය (ගලතුරු මූළ)
2. උත්තර මූලායතනය
3. සරොගාම මූලායතනය
4. සේනාපති මූලායතනය
5. මහනෙත්පා මූලායතනය
6. දක්ඛිණ මූලායතනය
7. කප්පූර මූලායතනය
8. වහදු මූලායතනය[20]

යන ඒවාය. පැරකුම් රජු දවස සිදු කරන්නට යෙදුන ශාසන සංශෝධනයේ දී භික්ෂූන් සමගි කරවා ආයතන ප්‍රධානීන්ට ''මූල'' පදවි පිරිනමා ඇත. මෙහිදී තනතුරු පහක් එම තෙරවරුන්ට පිරිනමා ඇත. එනම්ඃ මහාසාමි, මූල, ථෙර, මහාථෙර, සහ පරිවෙණාධිපති යන ඒවාය. මෙයින් මුල් දෙක රාජ සම්මුතියෙන් පිරිනැමූ අතර අනෙක් පදවි සංඝ සම්මුතියෙන් පිරිනමා ඇත.[21] මෙකී අෂ්ට මූලායතනයන්හි වැඩසිටි තෙරවරුන්ගෙන් සිදු වූ ධර්ම ශාස්ත්‍රීය සේවාව අතිමහත්ය.

1. සෙලන්තර මූලායතනය

ගලතුරු මූල යනුවෙන් ප්‍රසිද්ධියට පත් වූ සේලන්තර මූලායතනය ආරම්භ වූයේ අනුරාධපුර යුගයේ මැද භාගයේදී ය. චූලවංස විස්තරයට අනුව දෙවන දාඨෝපතිස්ස (ක්‍රි. ව. 662-671) රජු විසින් ඉදිකරන ලද මෙම ආරාමය පසුව සුප්‍රසිද්ධ ආයතනයක් බවට පත්විය. එම රජුගේ මුණුබුරෙක් පැවිදි වී වන සෙනසුනක වාසය කරමින් සිටිය දී තමන්ට අනුශාසනා කරන්නට යැයි ආරාධනා කළේය. වන සෙනසුනින් පැමිණෙන්නට අකමැති වූ නිසා නැවත නැවතත් අයැද සිටි පසු උන්වහන්සේ භික්ෂු සංඝයා කිහිප දෙනෙක් සමඟ පැමිණ නතර වූ ස්ථානයේ විහාරයක්

කරවා උන්වහන්සේ ඇතුළු සංඝයාට පහසුව පිණිස සකස් කර දුන් විහාරය සෙලන්තර මූලායතනයයි.[22]

මෙම ආයතනයේ සිටි මුල් තනතුරු දැරූ තෙරවරුන් හඳුන්වා ඇත්තේ ගලතුරුමූල හිමිවරුන් වශයෙනි. ඒ බව වුත්තමාලාව හා වුත්තමාලා ව්‍යාඛ්‍යාවෙහි සඳහන් වේ.[23] ඒ අනුව මෙහි වැඩ වාසය කළ ප්‍රසිද්ධ හිමිවරුන් කිහිප නමක් පිළිබඳ තොරතුරු හමු වේ. එනම්:- ගලතුරුමූල නන්ද, ගලතුරුමූල සීල, ගලතුරුමූල මේධංකර, ගලතුරුමූල මෛත්‍රිය යන අයයි. මෙහි මුලින් නම් සඳහන් කළ නන්ද හිමියන් පැරකුම් රාජ්‍ය සමයේ කළ සංඝ සංශෝධනයේ දී රජුගේ ආරාධනයෙන් ඒ සඳහා සහභාගි වූ තෙර නමකි. ශ්‍රී සීල හිමියන් පිළිබඳ ව තොරතුරු වුත්තෝදය රචනා කළ සංඝරක්ඛිත මාහිමි දක්වයි. එහි සඳහන් වන අන්දමට සීල හිමි සංඝරක්ඛිත හිමියන්ගේ ආචාර්යයන් වහන්සේ ය.''යමෙකුගේ ඥාණ බලයෙහි එල්බ මවිසින් මෙවැනි අභිමත සිද්ධිකර පරාර්ථයක් සම්පාදිත වීද, මාගේ ගුරු වූ ගුණයෙන් ගරු වූ සේලන්තරායතනවාසී ඒ ශ්‍රී සීල නම් ස්ථවිර පාදයන් වහන්සේ ජය ගණිත්වා''[24] යනුවෙන් සඳහන් වී තිබීමෙන් ඒ බව පැහැදිලි වේ.

ශ්‍රී සීල හිමියන් සේලන්තර මූලායතනයට අයත් වූ තෙර නමක් නිසා උන්වහන්සේගේ ශිෂ්‍යයන් ද එම මූලායතනයට ම අයත් වූයේ යැයි දැක්විය හැකිය. ඒ අනුව උන්වහන්සේගේ පළමු ශිෂ්‍ය සංඝරක්ඛිත මාහිමියන්ගෙන් පාලි සාහිත්‍යයේ දියුණුවට ඉටු වූ සේවාව අනල්පය. මෙවකට සංස්කෘත භාෂාවෙන් පමණක් ලියවී තිබූ ඡන්දස් හා අලංකාර ග්‍රන්ථ පරිශීලනය කරමින් පාලි භාෂාවට අඩුවක්ව පැවති එකී ග්‍රන්ථ රචනා කරන්නට උන්වහන්සේට හැකිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වුත්තෝදය හා සුබෝධාලංකාරය යන ග්‍රන්ථ රචනා විය. මීට අමතරව සුසද්ධ සිද්ධි, යෝගවිනිච්ඡය හා ඛුද්දක සික්ඛා ටීකාව යන පාලි ග්‍රන්ථ ද මුන්වහන්සේගේය.

දිඹුලාගල අරඤ්ඤවාසී කාශ්‍යප හිමියන් ද ශ්‍රී සීල හිමියන්ගේ ශිෂ්‍යවරයෙකි. මුන්වහන්සේගෙන් සිදු වූ ශාස්ත්‍රීය සේවාව ද ඉහළය. තෙවලා බුදුදහමෙහි හා සංස්කෘත භාෂාවෙහි නිපුණයෙකු වූ මුන්වහන්සේ අභිධම්මත්ථ සංගහයට ''පෝරාණ ටීකාව රචනා කළහ. එසේම මෝහවිච්ඡේදනී නම් අභිධර්ම සංග්‍රහය ද උන්වහන්සේගේ වන අතර, පාලි ව්‍යාකරණඥයෙකු වශයෙන් චන්ද්‍රගෝමීන්ගේ ''චාන්ද්‍රව්‍යාකරණය'' හකුළුවා ''බාලාවබෝධන'' නම් පාලි ව්‍යාකරණ ග්‍රන්ථය ද රචනා කර ඇත. බුද්ධවංසය හා අනාගත වංසය ද, විමති විනෝදනිය ද මුන්වහසේගේ බව මලලසේකර මහතාගේ අදහසයි.[25] එපමණක් නොව ''සමන්තපාසාදිකා'' නම් විනය අටුවාවේ සිංහල සන්නය රචනා කරන ලද්දේ ද මෙතුමා යැයි සැලකේ. ඒ අනුව මුන්වහන්සේ භාෂාත්‍රයේ ම බුද්ධිමතෙකු බව අවිවාදයෙන් පිළිගැනේ.

පැරකුම් රජුගේ කාලයේ මාහිමි පදවියකින් පිදුම් ලැබූ තෙර නමක් ලෙස උදුම්බරගිරිවාසී මේධංකර හිමියන් පෙන්වා දිය හැකිය. උන්වහන්සේ පිළිබඳ තොරතුරු පැපිළියාන සන්නසෙහි විස්තර වේ.[26] උන්වහන්සේ සුනේත්‍රාදේවි පිරිවෙනේ මංගල මාහිමියන්ගේ හා රංමුංගොඩ විහාරාධිපති දීපංකර හිමියන්ගේ ආචාර්යවරයාය. මේධංකර හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ අතරින් ශේෂ ව පවතින්නේ පාලි මූලයන්ගෙන් සිංහලයට පරිවර්තනය කරන ලද ''විනයාර්ථසමුච්චය'' පමණි.[27]

සකල කලා සර්වඥ ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ගලතුරුමූල මහාසාමි තොටගමු විහාරයේ අධිපතිව වැඩ සිටි තෙරනමකි. ඒ අනුව කෝට්ටේ යුගයේ සිටි තොටගමුවේ රාහුල හිමියන් ද මෙම මූලායතනයට අයත් යැයි විශ්වාස කළ හැකිය. උන්වහන්සේ විසින් රචනා කරන ලද සැළලිහිණි සන්දේශය, කාව්‍යශේඛරය, පංචිකා ප්‍රදීප ආදි ග්‍රන්ථ සුවිශේෂී තැනක් උසුලනු ලබයි. මේ අනුව අනුරාධපුර යුගයේ මධ්‍යතන කාල පරිච්ඡේදයේ ආරම්භ වූ මෙම ආයතනය කෝට්ටේ යුගය තෙක් පැවතුණ බව පෙන්වා දිය හැකිය. පළමුවන රාජසිංහ රජුගේ ශාසන විලෝපයට හසු වීම නිසා මෙම ආයතනය විනාශ වී යන්නට ඇතැයි සිතිය හැකිය.

2. උත්තර මූලායතනය

උත්තරෝළ, උත්තරාළ්හක, උතුරළ යන නම්වලින් හැඳින්වෙන උත්තර මූලායතනය අභයගිරි විහාරයෙහි අග්‍රායතනය වූ අතර, පොළොන්නරු රාජ සමයේ දළදා වහන්සේ හා පාත්‍ර ධාතුව තිබූ නිත්‍ය වාසස්ථානය වූ බව ද පොළොන්නරුවේ වෙළෙක්කාර සන්නසේ සඳහන් වේ.[28] උත්තරෝල විහාරය පිළිබඳ ව විශේෂ පුවතක් චූලවංසයෙහි එයි. කසුප් නම් රජුට මාණ නමින් ප්‍රසිද්ධ ඈපාණ නම් පුතෙක් විය. ඔහුගේ ජ්‍යෙෂ්ඨ සහෝදරයා මානවම්ම විය. හෙතෙම දිනක් ගොන්සමුදුර නම් තොටෙහි සිට අක්ෂර මාලාව ගෙන ජප කරන්නට විය. (එහි අපේක්ෂාව වූයේ කඳකුමරුගෙන් වරම් ලබා ගැනීමය) එහිදී ඔහුගේ ඇසක් අන්ධ විය. අඳ භාවයේ සිට රජකම් කිරීම නුසුදුසු යැයි කල්පනා කළ ඔහු සිය කණිටු සොහොයුරු මානහට රාජ්‍ය භාර දී අභයගිරියට ගොස් පැවිදි විය. ඔහුගේ අංගවිකලත්වය පිළිබඳ ව නොතකූ අභයගිරිවාසීහු ඔහුට පැවිද්ද ලබා දුන්හ. රාජ්‍ය ලද මානවම්ම උත්තරෝල විහාරය කරවා භික්ෂූන් හත්සියකගේ ප්‍රධානියා කොට උන්වහන්සේට දුන්නේය. දළදා වහන්සේ ද එහි තැන්පත් කරවීය. උන්වහන්සේගේ අවවාද අනුශාසනා මධ්‍යයේ රජු රාජ්‍ය ගෙන ගියේය.[29] මෙයින් පැහැදිලි වන්නේ මෙම විහාරය අභයගිරිකයන්ට අයත් වූවක් ලෙස ය.

මෙම විහාරයේ වැඩසිටි උගත් තෙරවරුන් අතර අනුරුද්ධ ආචාර්යයන් ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. උන්වහන්සේ මෙහි වැඩසිටි බව උන්වහන්සේ විසින් රචිත අනුරුද්ධ ශතකයේ සඳහන් කර ඇත.[30] මුන්වහන්සේගේ අනිත් කෘති වන්නේ අභිධම්මත්ථ සංගහ, නාමරූප පරිච්ඡේදය, පරමත්ථවිනිච්ඡය, යන අභිධර්ම ග්‍රන්ථයන්ය. මෙය අභයගිරිවාසීන්ගේ ප්‍රමුඛ අධ්‍යාපන අයතනය ලෙස සම්භාවනාවට පාත්‍ර වූවකි.

3. සරොග්‍රාම මූලායතනය

සරොග්‍රාම, සරසිගාම, විල්ගම්මුළ යනාදි නම්වලින් හැඳින්වෙන්නේ එම ආයතනයයි. සරොග්‍රාම යනුවෙන් සඳහන් වන්නේ පැරකුම් රජුගේ යුද කඳවුරක් පිහිටි ගමකි. එම ගමෙහි ඔහු විසින් ප්‍රාසාදයක් කළ අතර ඔහුගේ දේවිය ද තවත් පහයක් ඉදිකරවූවාය. මෙවක අභිධානප්පදීපිකා නම් පාලි කෝෂ ග්‍රන්ථයෙහි කර්තෘ මොග්ගල්ලාන මහාසාමි මෙම මූලයෙහි ප්‍රධානත්වය ඉසිලූහ. මුන්වහන්සේ විසින් රචනා කරන ලද මොග්ගල්ලාන ව්‍යාකරණය නිසා පාලි

වියරණ සම්ප්‍රදායක් බිහිවිය. සංස්කෘත ප්‍රසිද්ධ ව්‍යාකරණයක් වූ ''චාන්ද්‍රව්‍යාකරණය'' මුල් කොට ඇති වෙනත් ව්‍යාකරණ ග්‍රන්ථ ඇසුරු කරමින් මෙම ග්‍රන්ථය රචනා කර ඇත.[31] මුන්වහන්සේ සංස්කෘත භාෂාවෙහි නිපුණයෙක් බව ද පිළිගැනේ. මෙතුමාගේ අනුජාත ශිෂ්‍ය පියදස්සි හිමියන් විසින් පදසාදන ටීකාව රචනා කර ඇත.

විල්ගම් වෙහෙර පිළිබඳ ව ධාතුවංසයෙහි සඳහන් වන අතර සිංහල බෝධිවංසය ලියන ලද්දේ සිව්වැනි පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1302-1326) රජු දවස විල්ගම්මූලයෙහි සංඝනායක තෙර වූ කැලණි විහාරයේ අධිපති තෙරුන් විසිනැ'යි දැක්වේ.[32] උන්වහන්සේ විසින් රචනා කරන ලද අනෙකුත් ග්‍රන්ථ වන්නේ අනාගතවංසය, සූරිය ශතකය යන ග්‍රන්ථ බව සුළු බෝධිවංසයේ දැක්වේ.[33] කෝට්ටේ යුගය වන විට මෙම ආයතනය ද පරිහානියට පත්වන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් පසුකාලයේ දී පිරිවෙන් ක්‍රමය ඇතිවීමත් සමග මෙනමින් පිරිවෙනක් තිබූ බව සඳහන් වේ.[34] එය මෙම මූලායතනය යැයි සිතිය හැකිය.

4. සේනාපති මූලායතනය

චමුපති මූලායතනය, සේනාපති රාජ, සෙනෙවිරත්මූල යන නාමයන්ගෙන් හැඳින්වෙන මෙම ආයතනය පිහිටුවන ලද්දේ 111 අග්බෝ (ක්‍රි. ව. 637-653) රජු දවස ඔහුගේ අමාත්‍යවරයෙකු වූ පොත්ථසාත නම් ඇමතිවරයා විසින් ය. මෙය ජේතවන විහාරයට අයත් වූවක් බව ''විහාරෙ ජේතනාමකො'' යනුවෙන් මහාවංසයෙහි සඳහන් වීමෙන් පැහැදිලි වේ.[35] කෝට්ටේ යුගය දක්වා ම ආයතනයක් වශයෙන් ප්‍රසිද්ධියට පත්ව තිබුණත් මෙහි සිටි තෙරවරුන්ගේ නම් හෝ කරන ලද ශාස්ත්‍රීය සේවාව පිළිබඳ ව තොරතුරු හමු නොවේ. එහෙත් වුත්තමාලා කාරක ගතාරාභිධාන මහාසාමීන් විසින් මෙම මූලායතනයේ වැඩසිටි අධිපති වහන්සේ වර්ණනා කර ඇත්තේ මහත් උත්කර්ෂයෙනි.[36] මෙය අනුරපුර ජේතවන සාගලික නිකායට අයත් වූවක් බව මෙම විස්තරවලින් පැහැදිලි වේ.

5. මහනෙත්පා මූලායතනය

මහාවංස විස්තරයට අනුව පස්වන අග්බෝ (ක්‍රි. 698-704) රජු විසින් මහනෙත්පා මූල සාදවා අභයගිරි හා ජේතවන දෙනිකායේ සංඝරත්නයට පූජා කළ බව සඳහන් වේ.[37] මෙහි අයතනාධිපතිවරුන් ලෙස වාතගිරි විහාරාධිපති සුමංගල, රංමුංගොඩ දීපංකර, සිරි ඝනානන්ද පරිවෙණාධිපති මෛත්‍රිය යන යතිවරයන් වහන්සේලා ප්‍රමුඛ වේ. මෙහි සුමංගල හිමියන් පූජාවලි කර්තෘ මයුරපාද පිරිවෙන්පති හිමියන්ගේ ආචාර්යවරයාය. මුන්වහන්සේ විසින් දින විසි එකක් ඇතුළත අභිධම්මත්ථවිභාවිනී ටීකාව කළ බව සඳහන් වේ. අභිධර්මාර්ථ විකාසිනී ටීකාව ද මුන්වහන්සේගේ ය.[38] සුමංගල හිමියන්ගේ නමට මුලින් ''මහනෙත්පාමූල'' යන නම ව්‍යවහාර වී තිබීමෙන් මුන්වහන්සේ මෙම ආයතනයේ තෙර නමක් බව පැහැදිලි වේ.[39] කෝට්ටේ රාජ්‍ය කාලය වනවිට මහානේත්‍රපාසාද මූලය අතිශයින් විශ්ව කීර්තියට පත් වූයේය. මේ කාලයේ මෙහි අධිපතිත්වය ඉසිලූ මෛත්‍රිය හිමියන් වනවාසී නිකායික යතිවරයෙකු වශයෙන් ප්‍රසිද්ධියට පත්

විය. මුන්වහන්සේට පෙර වීදාගම තෙරුන් මෙහි අධිපතීන් වහන්සේ විය. උන්වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ අතර ලෝවැඩ සඟරාව, කව්ලකුණු මිණිමල, බුදුගුණාලංකාරය, හා දහම්ගැට මාලාව ප්‍රමුඛ වේ.

මෙපරිද්දෙන් ශාස්ත්‍රීය සේවාවන්හි නිරත වූ බොහෝ තෙරවරු වැඩසිටි ආයතනයක් ලෙස හැඳින්වෙන මෙම ආයතනය මුල්කාලයේ අභයගිරි හා ජේතවන නිකායට අයත් වුවත් මහ පැරකුම් රජු කල තුන් නිකාය එක්සේසත් කිරීමේ ශාසන සංශෝධනයෙන් පසු මහාවිහාරවාසී මහසඟනට වාසභූමිය වූ බව සඳහන් වේ.[40] එතැන් පටන් කෝට්ටේ යුගය වන තෙක් එහි ශාසනික කීර්ති යශෝරාවය පැතිර ගියේය. පොළොන්නරු යුගයේ ශාසන සංශෝධනයෙන් පසු මෙහි අධිපතිත්වයට පත්වූයේ ''දිඹුලාගල මහා කාශ්‍යප'' හිමියන්ය.

6. දක්ඛිණ මූලායතනය

දක්ඛිණ මූලායතනය වළගම්බා (ක්‍රි. පූ. 89-77) රජුගේ අමාත්‍යවරයෙක් වශයෙන් සිටි උත්තිය නැමැත්තා විසින් කරවන ලද්දකි. අභයගිරියේ විසූ භික්ෂු පිරිසක් ධර්මරුචි නිකායෙන් වෙන් ව ගොස් සාගල නම් තෙර කෙනෙකුගේ මූලිකත්වයෙන් සාගල නමින් ප්‍රසිද්ධියට පත් ව වැඩ විසූ විහාරයයි. පසුකලෙක දී මහසෙන් රජු විසින් (ක්‍රි. ව. 274-301) මෙම ආයතනයේ භික්ෂූන්ට ජේතවන නම් විහාරය සාදවා පූජා කළ බව සඳහන් වේ.[41] සද්ධාතිස්ස රජු විසින් (ක්‍රි. පූ. 137-119) කර වූ දක්ඛිණගිරි නමින් විහාරයක් තිබුණු අතර එය මහාවිහාරිකයන් සතු විය. දෙවන කස්සප රජු (ක්‍රි. ව. 653-662) නිකායික බලපෑම් හේතුවෙන් මෙහි වූ චෛත්‍යය බිඳින ලදැයි වාර්තා වේ.[42] එම නිසා පොළොන්නරු යුගයෙන් පසු මේ පිළිබඳ කිසිදු වාර්තාවක් හමු නොවේ. මුල් කාලයේ වැඩසිටි තෙරවරුන් හා අධිපතීන් පිළිබඳව ද තොරතුරු හමු නොවුණත් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පැවතිණ. ජේතවන නිකායට අයත් තෙරවරුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ පිළිබඳ ඓතිහාසික වාර්තා හමු නොවීම ද නිසා මේ ආයතනයෙන් ශාස්ත්‍රීය සේවාවක් සිදු වුණේ ද යන්න කිව නොහැකිය. එහෙත් කලින් කලට සිටි රජවරුන්ගේ නොමද අනුග්‍රහය දක්ඛිණ මූලායතනයට ලැබී ඇති බව කිවහැකිය.[43]

7. කප්පූර මූලායතනය

හතරවන කාශ්‍යප රජු විසින් (ක්‍රි. ව. 885-902) කරවන ලද කුඩා විහාරයක් බව දළදා පූජාවලියේ විස්තර වේ.[44] මෙයට ''කපාරා'' යන නාමය ද භාවිතා කෙරෙන අතර එය යෙදුණේ ''කස්සපරාජ'' යන්න කෙටි කිරීමෙනැයි මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියෝ සඳහන් කරති.[45] මෙය අභයගිරි නිකායට අයත් වූවක් යැයි ''අභයගිරි වෙහෙර කපාරා මුලට් සලමෙය්වන් පව්කරයේ සගුන්''[46] යන හතරවන කසුප් රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ සඳහන් වීමෙන් පෙනී යයි. පැරකුම් රජුගේ ශාසන සංශෝධන අවස්ථාව වන විට කපාරා මූලය මහාවිහාරයට අභියෝගයක් ව පැවතුණත් පසුකලකදී නිහඬ ආයතනයක් වූවා සේ කතිකාවත වලංගු වීමෙන් පසු බෙහෙවින් අභාවයට ගිය බව ද සඳහන් වේ.[47] මුල්කාලයේ මෙම ආයතනයට ද විවිධ

රජවරුන්ගෙන් අනුග්‍රහය ලැබුණු අතර පසුකාලීනව සිටි රජවරුන්ගෙන් එකී අනුග්‍රහය ලබාදීම මගහැරී ඇත.

8. වහදු මූලායතනය

වාදු, වාහදීපක, වාදුම්මුල යන නම්වලින් හැඳින්වෙන මෙම ආයතනය මානවම්ම රජු විසින් (ක්‍රි. ව. 689-698) කරවන ලද්දකි. අභයගිරි චෛත්‍යයට ආසන්නව මහාකපාරාවට ද සමීපව මේ ආයතනය පිහිටි බව විද්වතුන්ගේ මතයයි. මෙය ද ආයතනයක් වශයෙන් පැවතුණත් සිදු වූ ශාස්ත්‍රීය සේවාවන් පිළිබඳ තොරතුරු හමු නොවේ. අනෙකුත් ආයතනයන්ට මෙන් ම මෙම ආයතනයට ද බොහෝ රජවරුන්ගේ අනුග්‍රහය ලැබී ඇති අතර වරින් වර සිටි රජවරුන් විසින් ප්‍රතිසංස්කරණ ආදි කටයුතු ද සිදු කොට ඇති බව පෙනේ.

ඉහතින් සඳහන් කරන්නට යෙදුණ මහාවිහාර, අභයගිරි හා ජේතවන නිකායයන්ට අයත් අෂ්ට මූලායතනයන් ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් පැවතුණි. මෙකී අධ්‍යාපන ආයතනවල වැඩසිටි තෙරවරු අතරින් බොහෝ දෙනෙක් පාලි සාහිතයයේ උන්නතිය උදෙසා අමිල මෙහෙවරක් ඉටුකළ අය වූහ. දිඹුලාගල මහා කාශ්‍යප, සාරිපුත්ත සංඝරාජ මාහිමි, අනුරුද්ධ මහා ස්වාමි, සංඝරක්ඛිත හිමි, මේධංකර හිමි ආදිහු ඉන් ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. ඒ අනුව අෂ්ට මූලායතන පාලි සාහිත්‍යයේ දියුණුව වෙනුවෙන් මහඟු සේවාවක් කළ අධ්‍යාපන ආයතන වශයෙන් පැවතුන බව කිව හැකිය.

මෙකී අධ්‍යාපන ආයතනවලින් වැඩිම ආයතන ප්‍රමාණයක් බිහි වී ඇත්තේ අභයගිරි සම්ප්‍රදායට අයත්වය. එය ගණනින් සතරකි. අනෙක් සතර මහාවිහාර හා ජේතවන නිකායයන්ට අයිති විය. මහාවිහාරයෙන් තොරවූ අධ්‍යාපන මධ්‍යස්ථානවල නක්ෂත්‍රය, මන්ත්‍ර ශාස්ත්‍ර, වෛද්‍ය ශිල්පය, සංස්කෘත භාෂාව හා විවිධ දර්ශන ආදිය ඉගැන්වූ අතර වඩාත් ජාත්‍යන්තර සබඳතා පවත්වා ගනිමින් නාගර්ජුන ආදි ආචාර්යවරුන්ගේ මතවාද ද සාකච්ඡාවට බඳුන් කරගන්නා ලදි. මුලින් දකුණු මූලයෙහි විසූ සාගලිකයෝ මහසෙන් රජුගේ කාලයේ ජේතවන විහාරය ලැබ අභයගිරිකයන් තරම් ම මහායානයට නැඹුරු නොවෙමින් ස්වාධීන අධ්‍යාපන ක්‍රමවේදයක් ගෙන ගිය බව පෙනේ.

මෙකී අෂ්ට මූලායතනයන් ගෙන් වැඩි ප්‍රමාණයක් අනුරාධපුර යුගයේ ආරම්භ වී පොළොන්නරු යුගයේ දී ප්‍රසිද්ධ අධ්‍යාපන අයතන බවට පත් වී කෝට්ටේ යුගය තෙක්ම ව්‍යාප්ත වී ගිය අයුරු දැකිය හැකිය. විශේෂයෙන් ම අභයගිරි නිකායට අයත් මූලායතන වැඩි දියුණු වන්නට වූයේ ඒ ඒ කාලවල දී සිටි රජවරුන්ගේ අනුග්‍රහය ඒවාට ලැබීම නිසාය. එසේම මහායාන දර්ශනය හා බෝසත් සංකල්පය අභයගිරි නිකායේ ප්‍රමුඛ ඉගැන්වීමක් වූ නිසා ඒ කෙරෙහි වැඩි දෙනාගේ අවධානය යොමු විය. මෙකී කරුණු විශ්ලේෂණය කිරීමේදී අෂ්ට මූලායතන ශ්‍රී ලාංකේය අධ්‍යාපන සම්ප්‍රදායේ දියුණුව වෙනුවෙන් අමිල මෙහෙවරක් ඉටුකර ඇති බව පෙන්වා දිය හැකිය.

ආන්තික සටහන්

[1] Mukhrji, R. K., Ancient Indian Education, Jeorge Allen & Unwin Limited, 1959, p. 394.

[2] මහාවංසය, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 123 පිටුව.

[3] අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 12 පිටුව.

[4] ආනන්ද මෛත්‍රිය හිමි, බලන්ගොඩ, ෆාංසි එන් සුං සුං දෙනමගේ ගමන් විත්ති, සමන් ප්‍රකාශකයෝ, මහරගම, 1958. 55 පිටුව.

[5] අත්ථසාලිනි, හේ. වි. මු. 25 පිටුව.

[6] සමන්තපාසාදිකාව, හේ. වි. මු. 1948, 578 පිටුව.

[7] මහාවංසය, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 117 පිටුව.

[8] මහාවංසය, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 33 පරි. 80-84 ගාථා, 135 පිටුව.

[9] මහාවංසය, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 33 පරි. 97-99 ගාථා, 136 පිටුව.

[10] නිකායසංග්‍රහය, සංස්. ඩී. පී. ආර්. සමරනායක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960, 74 පිටුව.

[11] රාහුල හිමි, වල්පොල, ලංකාවේ බුදුසමයේ ඉතිහාසය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1962, 116 පිටුව.

[12] අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 27 පිටුව.

[13] නිකායසංග්‍රහය, සංස්. ඩී. පී. ආර්. සමරනායක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960, 12 පිටුව.

[14] වෝහාරතිස්ස රජුගේ කාලයේ මෙරටට පැමිණි වෛතුල්‍යවාදීන්ට එකතු වූ ඇතැම් අභගිරිවාසීහු එම දහම පිරිසිදු බුදුදහම යැයි පවසා කටයුතු කරන්නට වූහ. මහාවිහාරිකයන් එය මිථ්‍යා දහමක් යැයි ඒත්තු ගැන්වූ විට රජු වෛතුල්‍යවාදීන්ට දඩ නියම කරන්නට විය. මෙයට බියෙන් පසු වූ ඔවුහු දකුණුගිරි නම් විහාරයට ගොස් සාගල නම් තො කෙනෙකුගේ යටතේ විසූහ. එමනිසා ඔවුන් සාගලික නමින් ප්‍රසිද්ධ විය.

අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 29 පිටුව.

[15] මහාවංසය, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 84 පරි. පි. 345

[16] -එම- 59 පරි. 59 ගාථාව, 245 පිටුව.

[17] -එම- 78 පරි. 33 ගාථාව, 310 පිටුව.

[18] පූජාවලිය, සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1997, 105 පිටුව.

[19] විමලජෝති හිමි, විලඹයේ, පොළොන්නරු යුගයේ පාලි සාහිත්‍යය, ශ්‍රී දේවී ප්‍රින්ටර්ස්, නැදිමාල, 2004, 54 පිටුව.

[20] පඤ්ඤාලෝක හිමි, මීගොඩ, ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, ඇස. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002, 179 පිටුව.

[21] අනාගතවංසය, සංස්. වටද්දර මෙධානන්ද හිමි, සංඥාපනය, v පිටුව.

[22] චූලවංසය, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, අභිනව විශ්‍රැත යන්ත්‍රාලය, කොළඹ, 1928, 57 පරි. 33-39 ගාථා, 135 පිටුව.

[23] පඤ්ඤාලෝක හිමි, මීගොඩ, ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002, 180 පිටුව.

[24] සෙලන්තරායතන වාසික සීල ථෙර - පාදො ගුරු ගුණ ගරු ජයතමමෙසො
යස්සපජ්භාවමවලමග මයොදිසොසි - සම්පාදිතො'හිමත සිද්ධකරො පරත්ථො

වුත්තෝදය, සමාප්ති ගාථා, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ගාවිඩ් පෙරේරා, කොළඹ, 1946, 125 පිටුව.

[25] Malalasekara, G. Dictionary of Pali Proper name, Vol. 1, London, 1960, p.1221.

[26] සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය, ඒ. වී. සුරවීර, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1971, 104 පිටුව.

[27] විමලජෝති හිමි, විලඔයේ, පොළොන්නරු යුගයේ පාලි සාහිත්‍යය, ශ්‍රී දේවී ප්‍රින්ටර්ස්, නැදිමාල, 2004, 50 පිටුව.

[28] ශිලාලේඛන සංග්‍රහය 3, මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි, ඩී. පී. දොඩංගොඩ සහ සමාගම, මොරටුව, 1951, 166 පිටුව.

[29] චූලවංසය, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, අභිනව විශ්‍රැත යන්ත්‍රාලය, කොළඹ, 1928, 57 පරි. 1-26 ගාථා, 134 පිටුව.

[30] ජ්‍යෝත්ස්නා හිමාංශොරිව යන්මුඛෙන්ද්‍රෝර්
නිෂ්‍යන්දතෙ සූත්ති රසෞ සුධීරඃ
ඉදං ව්‍යධතෙතෝත්තරමූල භාර
රතතාංකුරො පස්ථවිරානුරුද්ධඃ

අනුරුද්ධ ශතකය, 101 ශ්ලෝකය. 38 පිටුව.

[31] ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1 කාණ්ඩයේ 11 කොටස, කොළඹ, 1971, 557 පිටුව.

[32] ධාතුවංසය, සංස්. මකුළුවේ පියරතන හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1941, 19, 48, පිටු

[33] සුළුබෝධිවංසය, සංස්. සෝමපාල ජයවර්ධන, සිංහල පුස්තක සමිතිය, කොළඹ, 1991, 32, 33 පිටු

[34] අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 63 පිටුව.

[35] පොත්ථසාතවිහයො පඤ්ඤෝ - විහාරෙ ජෙතනාමකො
සෙනාපති රාජනාමං - පරිවෙණං සමාපයී

මහාවංස, 44 පරි. 22 ගාථා, 156 පිටුව

[36] පජා පුඤ්ඤබීජප්පිතොදාර ඛෙත්තො
තපොතොය සුද්ධි කතාසං සණොසො
දයාසීහ තෙලස්ස සොවණ්ණපත්තො
විරාජෙති සෙනාපතිමූල ථෙරො

වුත්තමාලාව, 43 පද්‍යය.

[37] කාරෙත්වාන පරිච්ඡේදං - මහානෙත්තාදිපාදිකං
තෙසමෙව අදා කොට්ඨිං - වාගෙ සො දෙවතිස්සකං

මහාවංස, 46 පරි. 2 ගාථා, 272. පිටුව

[38] අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 64 පිටුව.

[39] විමලජෝති හිමි, විලඔයේ, පොළොන්නරු යුගයේ පාලි සාහිත්‍යය, ශ්‍රී දේවී ප්‍රින්ටර්ස්, නැදිමාල, 2004, 57 පිටුව.

[40] අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 67 පිටුව.

[41] නිකායසංග්‍රහය, සංස්. ඩී. පී. ආර්. සමරනායක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960, 11 පිටුව.

[42] මහාවංස, 42 පරි. 142 ගාථා, 148 පිටුව

[43] වැඩි විස්තර සඳහා බලන්න. අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 67-69 පිටු.

[44] දළදා පූජාවලිය, සංස්. පුංචිබණ්ඩාර සන්නස්ගල, 1954, 78 පිටුව.

[45] ශිලාලේඛන සංග්‍රහය 1, මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි, ඩී. පී. දොඩංගොඩ සහ සමාගම, මොරටුව, 1951, 115.

[46] අමරවංස හිමි, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, 194 පිටුව.

[47] අදිකාරි අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991, 69 පිටුව.